රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No: HA/05/01/06/02/09 2024/2026
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.06. 11

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු වෙත

**ස්වදේශ කටයුතු අංශය යටතේ ඇති සංචාරක බංගලාවල බංගලා භාරකරුවන් හා බංගලා භාරකරු සහයකවරුන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026**

ස්වදේශ කටයුතු අංශයට අයත් සංචාරක බංගලාවල සේවයේ නියුතු බංගලා භාරකරුවන් හා බංගලා භාරකරු සහයකවරුන් සඳහා 2026 වර්ෂයට ක්‍රියාත්මකවන පරිදි වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.(අයදුම්පත්‍රය ඇමුණුම 1හි දක්වා ඇත)

02. 2021.11.24 දිනැති ඉහත නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටිය ප්‍රකාරව ,

- තමා දැනට සේවයේ යෙදී සිටින සංචාරක බංගලාවේ අඛණ්ඩව වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.
- එකම සංචාරක බංගලාවක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 05කට වැඩි සේවා කාලයක් සේවය කර ඇති නිලධාරීන් සහ එකම දිස්ත්‍රික්කයක ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් (ස්ථාන මාරු සලකා බලන වසරට) ස්ථාන මාරුවීම්වලට යටත් වේ.
- සේවා අවශ්‍යතාවය මත හෝ සුහද ස්ථාන මාරු මත ස්ථානමාරු සිදුකරන ලද නිලධාරීන් ස්ථාන මාරුව ක්‍රියාත්මක වූ දින සිට නව සේවා ස්ථානයේ වසර 02ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාර්ෂික ස්ථානමාරුවීම්වලට යටත්වේ.

03. ඒ අනුව, ඔබ දිස්ත්‍රික්කයේ පිහිටි ස්වදේශ කටයුතු අංශයට අයත් සංචාරක බංගලාවල සේවයේ නියුතු උක්ත සුදුසුකම් ඇතුලුව ස්ථාන මාරු පටිපාටියේ සඳහන් අනෙකුත් කරුණු සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ අයදුම්පත්‍ර ඔබගේ නිර්දේශ සහිතව **2025.07.31** දිනට පෙර මා වෙත යොමුකරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

04. අදාළ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ වෙබ් අඩවියෙහි (www.moha.gov.lk) බාගත කිරීම්හි ස්ථාන මාරු පටිපාටිය යටතේ බාගත කරගත හැකිබව තවදුරටත් දන්වා සිටිමි.

අත්/කළේ- ජී.සී.එස්.තිලකරත්න
අතිරේක ලේකම්(පාලන)
ලේකම් වෙනුවට

කේ.ඩී.සී.එස්.කුමාරතුංග
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)